කාර්යාලය /அலுவலகம் / Office :
දුරකථන தொலைபேசி Telephone 0112034347
ෆැක්ස් பெக்ஸ் Fax 0112887422
විද්‍යුත් තැපෑල மின்னஞ்சல் E-mail agriculturemedia@gmail.com

මාධ්‍ය ඒකකය
ஊடகப் பிரிவு
MEDIA UNT

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation

මගේ අංකය எமது இல. My No.
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2025.09.16

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ

**අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වෙනුවෙන් අපි එකතු වෙලා වැඩකරමු.'' කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කේ.ඩී ලාල්කාන්ත මහතා පවසයි.**

කුකුළු මස් සහ බිත්තර ආශ්‍රිත නිෂ්පාදන හා විසිතුරු මසුන් අපනයන පහසුකරණ සහ ප්‍රවර්ධන වැඩසටහන අද (16) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කේ.ඩී ලාල්කාන්ත මහතාගේ සහභාගීත්වයෙන් බස්නාහිර පළාත් සභා නව ශ්‍රවනාගාරයේදී පැවැත්විණ.

මෙම අවස්ථාවට එක්වෙමින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කේ.ඩී ලාල්කාන්ත මහතා අදහස් පළ කළේය.

''අපට අවශ්‍ය තියෙන බාධාවන් ඉවත් කිරීමයි. ක්ෂේත්‍ර 4ක බාධා තියෙනවා බිඳින්න. පළවෙනි එක දේශපාලන බාධක. අපේ රටේ දේශපාලන සංස්කෘතිය රටේ ඉදිරි ගමනට බාධාවක් වෙලා තිබුණා. පසුගිය කාලයේ ගත්ත තීරණ පටු තීරණ නෙවෙයි. ඊළඟට ආර්ථික ක්ෂේත්‍රය. තුන්වන වන එක සමාජය. හතර සංස්කෘතිය. අපේ රට එකතැන පල්වෙන්නේ මේ ක්ෂේත්‍ර හතර තුළ තිබෙන බාධක නිසයි. මෙම ක්ෂේත්‍රවල ඍණාත්මක දේ ඉවත් කරලා ධනාත්මක දේවල් එක් කර ගත යුතුයි.

අපි ආහාර සුරක්ෂිතතා කමිටුව හරහා ආහාර පරිභෝජනය, එහි මිල, ගුණාත්මකභාවය ගැන අපි සාකච්ඡා කරනවා. අපි සාකච්ඡා කළා, කුකුල් මස්වල පිරිවැයට සාපේක්ෂව වැඩියි කියන එක.

ගියවර අයවැය විවාදයේදී අපි හඳුන්වලා දුන්නා, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කුකුල් මස් ව්‍යාපාරිකයින්ට තියෙනවා නම්, මේ වෙනකොට කුකුල් මස් කිලෝවක මිල රුපියල් 1400 වෙන්න බැහැ. ගොවියාගේ පිරිවැයට අදාළව ඔහුට අවශ්‍ය මිල ලබා දිය යුතුයි. පාරිභෝගිකයාගේ කොටස ගැනත් සිතිය යුතුයි. නැත්තම් එතන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. මේ සංකල්පය නිවැරදිව සොයා ගත්තොත් කාටවත් ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ.

ආණ්ඩුව ගන්න තීරණවලට රජය තවමත් ඇතැම් තැන්වලදී ගැලපිලා නැහැ. මේ ක්ෂේත්‍රවල තියෙන ප්‍රශ්නවලට අපි විසඳුම් ලබා දෙනවා. ඒ ගැන සුබවාදී ආකල්පයක් තබා ගන්න. පෞද්ගලික අංශයේ පිරිස් විවධ ව්‍යාපෘති සමඟ අපව හමුවන්න එනවා. ඒක වාසනාවක්.

සත්ව අභිජනනයේදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය තවමත් ඉන්නේ පහළ මට්ටමක. දේශපාලඥයෝ තමන්ගේ සාක්කුව බලා ගෙන වැඩ කරපු නිසයි රටේ ආර්ථික පරිහානියක් ඇති වෙලා තියෙන්නේ. තීන්දුවක් හරි විදිහට ගත්තොත් අපි ඒක කඩන්නේ නැහැ.

ඇයි කුකුළ් මස් ටින් නැත්තේ කියලා මං ඇහුවා. මට දැනගන්න ලැබුණා ටිකක් තියෙනවා කියලා. ඒ පැත්ත ගැන අප සිතා බැලිය යුතුයි. නිෂ්පාදන සෑමවිටම තාක්ෂණය සමඟ ඉදිරියට යා යුතුයි. අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වෙනුවෙන් අපි එකතු වෙලා වැඩකරමු.”

මෙම අවස්ථාවට කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ මහතා, කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් ඩී.පී.වික්‍රමසිංහ මහතා ඇතුළු අදාළ ක්ෂෙත්‍රයන් නියෝජනය කරමින් නිලධාරීන් සහභාගි විය.

මාධ්‍ය ඒකකය
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**